සැ.යු.- 2017.03.24 දින පළ වූ අංක 2012 දරන ගැසට් පත්‍රයේ I:I සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,013 - 2017 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2017.03.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 728 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 734 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 746 |


*සැ. යු.* -(i) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත 2017 මාර්තු මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 21 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රෙල් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් පොදු සුදුසුකම්වලින් සමන්විත අයවලුන් විය යුතුය.

*පොදු සුදුසුකම් :*

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

II. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

III. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

V. රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

2. පුරප්පාඩුව පවතින තනතුරු :

1) මාර්ග කම්කරු - III ශ්‍රේණිය (ශිල්පීය නොවන) - පුරප්පාඩු 01

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| මාර්ග කම්කරු - III ශ්‍රේණිය | රු. 24,250 -250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 |

*අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතුය.

2) මුරකරු - III ශ්‍රේණිය (ශිල්පීය නොවන) - පුරප්පාඩු 01

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* |
|---|---|
| මුරකරු - III ශ්‍රේණිය | රු. 24,250 -250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 |

*අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබිය යුතුය.

*3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.
III. පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ සතුටුදයක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.
IV. ඉහත සඳහන් තනතුරුවලට අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.
V. දනටමත් මෙම ආයතනයේ ආදේශක, අනියම් හෝ තාවකාලික සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

*4. බඳවා ගැනීමේ පිළිවෙළ*

I. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ.
II. අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු වේ. එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්/තැපැල් ස්ථානාධිපති විසින් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් පරීක්ෂණ අවස්ථාවට ඉදිරිපත් කළ යුතුය.
III. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කර ගන්නා ලද අයදුම්පත් 2017.04.21 වැනි දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, විල්ගමුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
IV. අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

*5. සහතික පිටපත්*

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය. ඡායා පිටපත් වඩාත් සුදුසු වේ.)

I. උප්පැන්න සහතිකය.
II. අධ්‍යාපන සහතික
III. තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ)
IV. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක් (01ක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
V. පළපුරුද්ද පිළිබඳ සහතික ඇත්නම් එම සහතික.

6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල විල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

7. යම් අයදුම්කරුවෙකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

| | |
|---|---|
| | |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

***විල්ගමුව ප්‍රාදේශීය සභාව***

***................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
04. ස්ථිර පදංචි ලිපිනය :——————————————.
05. තැපැල් ලිපිනය :——————————————.
06. ස්ථිර පදිංචි ප්‍රා. ලේ. කොට්ඨාසය :——————————————.
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.

08. උපන් දිනය :——————————————.

09. 2017.04.01 දිනට වයස :——————————————.

10. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. සා./පෙළ විභාගය :

වර්ෂය :—————— විභාග අංකය :——————

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උ/පෙළ) විභාගය ඃ

වර්ෂය :—————— විභාග අංකය :——————

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

11. පළපුරුද්ද :

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් :

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

13. වෙනත් සුදුසුකම් :

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද? යන වග :————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනගැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත් බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව මා හොඳාකාරවම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ......................................................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ /ආයතනයේ .........................................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

......................................................................,

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නිලමුද්‍රාව

නම :—————————

තනතුර :———————

දිනය :————————.

03-1317

---

**මහරගම නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - 2017

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පිරිමි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2017.04.20 වැනි දින දක්වා මවිසින් භාරගනු ලැබේ.

තනතුරු සඳහා අයදුම් කිරීමේදී මේ සමග පළ වී ඇති ආදර්ශ අයදුම්පත ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කර හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙල කරගත් අයදුම්පත් මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත් "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට 2017.04.20 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. **තනතුරු සංඛ්‍යාව හා වැටුප් පරිමාණය** :-

| | | | |
|---|---|---|---|
| විදුලි කාර්මික තනතුරු | - | 01 | PL2 – 2016(රා.ප.ච. 3/2016)<br>රු. 25,250-10x270-10x300-10x330-12x350-38,450/-<br>වැටුප් පරිමාණයේ (උපලේඛන II අනුව) |
| පැස්සුම්කරු තනතුරු | - | 01 | |
| ආදාහනාගාර ක්‍රියාකරු තනතුරු | - | 06 | |

02. **බඳවා ගන්නා ශ්‍රේණිය** :- **III පන්තිය**

03. **සුදුසුකම්** :

3.1 *අධ්‍යාපන සුදුසුකම්* :- අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

*3.2* වෘත්තිය සුදුසුකම් :- අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හා අවම වශයෙන් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)

04. **කායික සුදුසුකම්** :- සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

05. *වෙනත් සුදුසුකම් :-*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *වයස :-*

6.1 අවම සීමාව :- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු ය.
6.2 උපරිම සීමාව :- අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :-* සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | |
| සාමාන්‍ය දැනීම | 75 | 50% |
| පෞරුෂත්වය | 05 | |

08. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද/මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද පළාත් පාලන ආයතනවලට අදාල ආඥාපනත්වල විධිවිධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

09. මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

වී. ජී. විනීතා ඈපා,
ලේකම්.

2017.03.20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ........................................
තනතුර සඳහා අයදුම් පත්‍රය

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :
..............................................................................................................................
..............................................................................................................................

03. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

(iii) තාවකාලික ලිපිනය (සිංහලෙන්) :

..........................................................................................................................................................

..........................................................................................................................................................

05. උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය: ☐☐ දිනය : ☐☐

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :- අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐

(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය.)

08. විවාහක/අවිවාහක බව :................................

09. දුරකථන අංකඃ පෞද්ගලික :................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව :................................

(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම් :-

..........................................................................................................................................................

..........................................................................................................................................................

(සුදුසුකම් සහතික කිරීමට අදළ සහතික වල පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද :................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත් ) :

..........................................................................................................................................................

..........................................................................................................................................................

(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. (i) ඔබ කිසියම් සාපරාධි වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද ? (ඔව්/නැත)

(ii) ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක් ද?

..........................................................................................................................................................

..........................................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ..................... III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ......................................... III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

................................,

අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

03-1348

# පළාත් පාලන නිවේදන

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පවත්වන ලද අංක 1995 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදන අංක 11-1154/1 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඒ. බී. නිමල් රත්නායක වන මම ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අද ාළව වරිපනම් නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2016.10.12 දිනැති තීරණ අංක 3021 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව,
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2015 වර්ෂය සඳහා වූ තක්සේරුව 2017 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත්,

එකී පනතේ 134 වගන්තියේ (1) උප වගන්තියේ එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට 04% වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2017 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ගල්ගමුව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ගල්ගමුව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ලබාදිය යුතු බවටත්, තීරණය කරමි.

03-1238/1

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදන අංක 11-1154/2 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඒ. බී. නිමල්

රත්නායක වන මම, එකී පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2016.10.12 දිනැති තීරණ අංක 3022 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකු 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

03-1238/2

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/3 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා බලපත්‍ර මත ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටුකරන ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2016.10.12 දිනැති තීරණ අංක 3023 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2016 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

03-1238/3

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/4 පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ 150 වන වගන්තියේ (I) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3024 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,  
ලේකම්,  
ප්‍රාදේශීය සභාව,  
ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,  
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පවත්වාගෙන යනු ලබන මෙම පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

03-1238/4

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/5 පහත පරිදි සංශෝධනය විය යුතුය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක

වන මම, එකී පනතේ 153 වන වගන්තියේ (I) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩමක බද්ද නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3025 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

2017 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,
*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,
*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර, ඇති අනුපාතය ....... % ට අඩු වන්නේ නම්,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2017 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 2% වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධන නොකළ ඉඩම මත බද්ද 2017 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

03-1238/5

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/6 පහත පරිදි සංශෝධනය විය යුතුය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී.නිමල් රත්නායක වන මම, එකී පනතේ 147 හා 148 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව වාහන හා සත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3026 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

එකී වාහනය හෝ සභා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2017 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය, සමග කිය විය යුතු එම පනතේ 147 හා 148 වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි 1 වන තීරුවෙහි සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකුම එහි II තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ව බද්දක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී වාහන හා සත්ව බද්දට යටත් තැනැත්තෙකුට විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2017 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

03-1238/6

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 වැනි දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවු නිවේදන අංක 11-1154/7 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා සීමාව තුළ කුළී ගමන් යෑමේ අරමුණින් වාහන නවතා තැබීම සඳහා 2017 වර්ෂයට ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා සීමාව තුළ කුළී ගමන් යෑමේ අරමුණින් වාහන නවතා තැබීම සඳහා පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3027 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වන්තිය සමග කියවිය යුතු එම පනතේ අදාළ වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා සීමාව තුළ කුළී ගමන් යෑමේ අරමුණින් වාහන නවතා තැබීම සඳහා අදාළ ගාස්තු 2017 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/7

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 වැනි දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදන අංක 11-1154/8 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයට ප්‍රජා ශාලාව, ක්‍රීඩා පිට්ටනි කුළියට දීම, ආදාහනාගාර සේවාව සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, තාවකාලික අලෙවි කුටි කුළියට දීම සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම,

එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට ප්‍රජා ශාලාව, ක්‍රීඩා පිට්ටනි කුළියට දීම, ආදාහනාගාර සේවාව සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, තාවකාලික අලෙවි කුටි කුළියට දීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3028, 3029, 3030, 3031 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

***තීරණය***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට ප්‍රජා ශාලාව, ක්‍රීඩා පිට්ටනි කුළියට දීම, අ ාද ාහනාගාර සේවාව සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, තාවකාලික අලෙවි කුටි කුළියට දීම සඳහා ගාස්තු උපලේඛනවල සඳහන් වන ආකාරයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/8

---

## සංශෝධනයයි

### ගල්ගමුව ප්‍රාදේශීය සභාව

2016.11.25 වැනි දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදන අංක 11-1154/9 පහත පරිදි සංශෝධනය විය යුතුය.

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂයට විවිධ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල්, රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට විවිධ ගාස්තු අය කිරීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3032 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***තීරණය***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට විවිධ ගාස්තු අයකිරීම සඳහා ගාස්තු පැනවීම උපලේඛනවල සඳහන් වන ආකාරයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/9

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/10 පහත පරිදි සංශෝධනය විය යුතු යඃ

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

**2017 වර්ෂයට බැනර් ප්‍රදර්ශනය කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3033 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම උපලේඛනවල සඳහන් වන ආකාරයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/10

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදන අංක 11-1154/11 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

**2017 වර්ෂයට ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත (176 වැනි අධිකාරය)**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත (176 වැනි අධිකාරය) පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3034 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත (176 වැනි අධිකාරය) පහත සඳහන් ආකාරයට අයකරගත යුතු මුදල ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/11

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/12 පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

**2017 වර්ෂයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් ගල්ගමුව රෝහල, ගල්ගමුව ලංකා බැංකුව, ගල්ගමුව මහජන බැංකුව යන ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් ගල්ගමුව රෝහල, ගල්ගමුව ලංකා බැංකුව, ගල්ගමුව මහජන බැංකුව යන ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 දිනැති තීරණ අංක 3035 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට ගල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් ගල්ගමුව රෝහල, ගල්ගමුව ලංකා බැංකුව, ගල්ගමුව මහජන බැංකුව යන ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් නියමිත ගාස්තු ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/12

---

සංශෝධනයයි

**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

2016.11.25 දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදන අංක 11-1154/13 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

**2017 වර්ෂයට ජංගම අලෙවිය සඳහා ගාස්තු අයකිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම,

එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට ජංගම අලෙවිය සඳහා ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 වැනි දිනැති තීරණ අංක 3036 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ අදාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට ජංගම අලෙවිය සඳහා උපලේඛනවල සඳහා ගාස්තු ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/13

---

## සංශෝධනයයි

### ගල්ගමුව ප්‍රාදේශීය සභාව

2016.11.25 වැනි දින පළ කරන ලද අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදන අංක 11-1154/14 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

**2017 වර්ෂයට ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ගාස්තු අයකිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ. බී. නිමල් රත්නායක වන මම, එකී පනතේ අදාළ වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2016.10.12 වැනි දිනැති තීරණ අංක 3037 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, ගල්ගමුව.

2017 පෙබරවාරි 14 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ අද ාළ වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයට ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා උපලේඛනවලට අදාළ ගාස්තු ගල්ගමුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

03-1238/14

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයසිදු පලිහවඩන විපුලගුණරත්න මහරජවාසලගේ ගයාත්‍රී ඥාණානි ද අල්මේදා,
ලේකම්,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 30 වැනි දින.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුළිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි කුළිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, එකී පනතේ 9 වන වගන්තියේ (3) වැනි උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

03-1316/1

---

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තියේ (I) වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (I) වන උප වගනත්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 11811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්ද වූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල.

| *අතුරු ව්‍යවස්ථා අංකය* | *අතුරු ව්‍යවස්ථාවේ නම* |
|---|---|
| i | සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| ii | සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| iii | කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| x | පිහිනුම් තටාක |
| xi | අයිස් කර්මාන්තශාලා |
| xvi | කර්මාන්තශාලා |
| xvii | අවමංගල්‍ය සේවා සැපයුම් |
| xix | පදික මාරු ස්ථාන |
| xx | ඉදි කිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදි කිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම හා අධීක්ෂණය |
| xxii | මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම |

| *අතුරු ව්‍යවස්ථා අංකය* | *අතුරු ව්‍යවස්ථාවේ නම* |
|---|---|
| xxiii | ආදාහනාගාර විධිමත් කිරීම/පාලනය කිරීම/ගාස්තු අය කිරීම |
| xxiv | පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම |
| xxvi | ප්‍රජා ශාලා |
| xxix | වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම |

පිළිබඳ යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගැසට් පත්‍රයේ පළවන දින සිට පනවා ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් ලැබී අති බලතල ප්‍රකාරව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තීරණ අංක 2536 හා 2017.03.02 දිනැති තීරණය යටතේ තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයසිදූ පලිහවඩන මහරජවාසලගේ ගයාත්‍රි ඥාණානි ද අල්මේදා,
ලේකම්,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2017 මාර්තු මස 07 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-1316/2

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් අප ලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

## ලියාපදිංචි කළ යුතු මාර්ග නාම ලේඛනය

| අනු අංකය | . මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගුරුදෙණිය සිට දෙහිපාගොඩ දක්වා මාර්ගය | ගුරුදෙණිය | දෙහිපගොඩ | ඉළුක්ගොඩේ ගෙදර විමලසේන | ඩබ්. ජී. සුගතපාල | අඩි 470 | අඩි 10 |
| | | | | එච්. ජී. ධර්මරත්න | කේ.එම්.අබේරත්න | | |
| | | | | අයි. ආර්. ජී. එස්. බී. ප්‍රේමරත්න | එක්. එම්. ඉන්ද්‍රාණි | | |
| | | | | එච්. ජී. ඉලංගරත්න | ඩබ්. ජී. සුසන්ත | | |
| | | | | කේ. ජී. ජයසූරිය | එච්. ජී. විජේසිංහ | | |
| | | | | | එස්. එම්. අයි. විජේබණ්ඩාර | | |
| 2 | දවුලගල නිකේ ඇළ අතුරු මාර්ගය | වහුංකොහ පාර | වටදෙණිය පාර | කේ. ජී. නන්දාවතී | ඒ. කේ. ජී. සුනිල් රාජපක්ෂ | අඩි 350 | අඩි 10 |
| | | | | අයි. එල්. එම්. නවුෆර් | එම්. ජී. ඇසිලින් නෝනා | | |
| | | | | එම්. එච්. එම්. රිනාස් | චන්දන බණ්ඩාර රාජපක්ෂ | | |
| | | | | එම්. එන්. එම්. ඉර්ෂාඩ් | | | |
| 3 | අම්පිටියාවත්ත දෙමාලියද්ද කෙසෙල්වත්ත මාර්ගය | අම්පිටියාවත්ත දෙමාලියද්ද පැරණි පඩිපෙල අසල | අංකිලිපිටිය ගල්ඒදණ්ඩ කෙසෙල් වත්ත හරහා කොටගල්ඔළුව | ඒ. එම්. ජී. අලහකෝන් | ඒ. එම්. ජී අලහකෝන් | මීටර් 260 | අඩි 10 |
| | | | | කමලා වීරතුංග | ඒ. එම්. සී. එස්. අලහකෝන් | | |
| | | | | ඒ. එම්. නවරත්න | ඒ. එම්. දීපානි අලහකෝන් | | |
| | | | | කේ. එම්. අබේරත්න | ඒ. එම්. නවරත්න | | |
| | | | | | කේ. එම්. ප්‍රේමරත්න | | |
| 4 | හුරීගොල්ල වත්ත පාර | චන්ද්‍රසේකර ඉඩම අසලින් | ප්‍රේමරත්න ඉඩම් අසලින් | ඇළ මාර්ගය | එම්. කේ. ජී. ඩබ්ලිව්. ආර්. චන්ද්‍රසේකර | අඩි. 200 | අඩි 10 |
| | | | | | පී. ජී. ලැයිසා | | |
| | | | | | යූ. ජී. නන්දවතී | | |
| | | | | | ආර්. එම්. ජී. ගුණසිංහ | | |
| | | | | | ඩබ්. ජී. ප්‍රේමරත්න | | |
| | | | | | ඩබ්. පී. දිලීප වීරසිංහ | | |

03-1265

# විවිධ දැන්වීම්

## ගාස්තු සංශෝධනය කිරීම - 2017

### මාතර මහා නගර සභාව

මාතර මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන මාතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සේනක පල්ලියගුරුගේ වන මම ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 අධිකාරය යටතේ මහ නගර සභා ආඥා ා පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, මාතර මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් අය කරනු ලබන ගාස්තු පහත සඳහන් අනු ප්‍රමාණයන්ගෙන් සංශෝධනය කර අය කිරීමට 2016.08.16 වැනි දින පැවති සභාව මගින් තීරණ අංක 406 යටතේ තීරණය කර ඇති අතර එම සංශෝධිත ගාස්තු පහත සඳහන් පරිදි 2017.01.01 වැනි දින සිට අයකළ යුතු බවටත්, මේ සඳහා රජයේ බදු මුදල් ද අය කළ යුතු බවටත්, මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව, මාතර.

2017 මාර්තු මස 08 වැනි දින.

| | | රු. |
|---|---|---|
| 1. | වීථි රේඛා සහතික නිකුත් කිරීම | 300 |
| 2. | ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර නිකුත් කිරීම | 500 |
| 3. | ගොඩනැගිලි අයදුම්පත් සත්‍ය පිටපතක් බවට සහතික කිරීමේ ගාස්තු | 250 |
| 4. | ගොඩනැගිලි අයදුම්පත්‍ර නිකුත් කිරීම | 600 |
| 5. | ගොඩනැගිලි අයදුම්පත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු | 200 |
| 6. | පැරණි නිවසක් බවට සහතික ලබාදීමේ ගාස්තුව | 500 |
| 7. | නැවත ඉදිකිරීම සඳහා බලය පැවරීමේ සහතික ගාස්තු | 250 |
| 8. | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ගාස්තු | 200 |

ගාස්තු අය කරගෙන ලබා දෙන යන්ත්‍ර හා උපකරණ (පැය 01 ක් සඳහා)

* බැකෝ යන්ත්‍රය
* ට්‍රැක්ටරය
* ගල් රෝල
* ජල බවුසරය

} 2016 වර්ෂයේ අය කළ ගාස්තුම අදාළ වේ.

| | | |
|---|---|---|
| 1. | PC 40 බැකෝ එක්ස්කැවේටර් යන්ත්‍රය බදු දීම (ඉන්ධන හා ක්‍රියාකරවන්නා සමඟ) | 1,600 |
| 2. | සන අඩි 75 ට්‍රේලර් සහිත ට්‍රැක්ටරය (පැය 08 ක් සඳහා/ වැඩිවන පැය 01 සඳහා රු. 500) | 4,500 |
| 3. | ගල් රෝල ටොන් 08 (වැඩිවන පැය 01 සඳහා රු. 810) පැය 08 කාලයට | 8,000 |

03-1173

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.